## 5. සංස්කෘතිකාවබෝධය, මාධ්‍යයේ ස්වභාවය සහ එහි බලපෑම

**නිපුණතාව** : සංස්කෘතිය යන්න අවබෝධ කර ගනිමින් මාධ්‍ය ක්‍රියාකාරිත්වය හේතුවෙන් සංස්කෘතියේ ඇති වූ වෙනස් වීම් හා බලපෑම පිළිබඳ දැනුවත් ව විචාරශීලී ව කටයුතු කරයි.

**නිපුණතා මට්ටම** : 5.1 සංස්කෘතිය, එහි ස්වභාවය හා විශේෂතා අවබෝධයෙන් යුතු ව පැහැදිලි කරයි.

**කාලච්ඡේද** : 08 යි.

**ඉගෙනුම් පල** :
- සංස්කෘතිය යන්න පැහැදිලි කරයි.
- සංස්කෘතියේ ස්වභාවය හා විශේෂතා පිළිබඳ අවබෝධයෙන් යුතු ව විස්තර කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්:**

පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කරන්න.

**හැඳින්වීම**

- සංස්කෘතිය බිහි වූයේ සහ වර්ධනය වූයේ මානවයාගේ සම්බන්ධතා සමඟ ම බව පෙන්වා දිය යුතු ය. අන් සියලු සත්ත්වයන්ගෙන් මිනිසා ගුණාත්මක ලෙස වෙනස් ව හඳුනා ගැනීමේ මූලික ම සාධකය සංස්කෘතිය වේ.
- සංස්කෘතිය යනු ප්‍රකෘතියේ විකෘතිය යි. සංස්කෘතිය පරිණාමයේ දී සහ එය වර්ධනයේ දී ප්‍රකෘතියේ නියමයන්ට සීමා නො වෙමින් සංස්කෘතියට සහ සමාජයට අදාළ නියමයන්වලට අනුකූල ව කටයුතු කරයි. මානවයා සිය සමාජ සහ පෞද්ගලික ජීවිතය සංවිධානය කර ගන්නේ ඊට අනුකූලව ය. ප්‍රකෘතිය මානව අවධානයට හා ක්‍රියාකාරිත්වයට නතු වීමෙන් ගොඩනැගෙන සහ නිර්මාණය කරන සියලු වටිනාකම් සංස්කෘතිය ලෙස සැලකිය හැකි ය.
- සංස්කෘතිය මිනිසා විසින් මිනිසාගේ ලැදියා සහ අවශ්‍යතා ඉටු කිරීමේ අරමුණින් සිදු වන අඛණ්ඩ ක්‍රියාවලියකි. මුලින් ම Culture යන වචනය බිහි වූයේ ලතින් භාෂාවෙහි වන අතර එය cultus යන වචනයෙන් බිඳී ආවකි. සංස්කෘතිය යන වචනයේ මූලික අර්ථය යම් දෙයක් වගා කිරීම, පිළිසකර කිරීම, රෝපණය කිරීම යන්න ය.
- මෙම වචනය කෘෂිකර්මාන්තය (Agriculture) සඳහා මුලින් භාවිත කරන ලද්දේ මාර්කස් පර්සියස් කැටෝ (Marcus Porcius Cato 234-149) විසිනි. ඉන් අනතුරු ව රෝම ජාතිකයන් සංස්කෘතිය

යන වචනය විශේෂණයක් ලෙස භාවිතයට ගනිමින් එය භාෂාවේ සංස්කෘතිය, හැසිරීමේ සංස්කෘතිය ආදි වශයෙන් යොදා ගනිමින් එය මිනිසාගේ සංස්කෘතිය දක්වා සමීප විය. එසේ ම රෝම කවිකයෙකු දාර්ශනිකයෙකු සහ රාජ්‍ය පාලකයෙකු වූ මාර්කස් ටුලිස් සීසර් (Marcus Tullius Cicero 106-43) විසින් මානව අධ්‍යාත්මිකත්වයට අදාළ ව සංස්කෘතිය යන වචනය භාවිත කරන ලදි. ඔහු ආත්මයේ සහ බුද්ධියේ සංස්කෘතිය ලෙස දර්ශනය සැලකූ අතර මිනිසාගේ බුද්ධිය සහ ආධ්‍යාත්මය පරිපූර්ණත්වයට පත් කර ලීමේ සංස්කෘතික ගුණයක් දර්ශනයට ඇති බව සීසර් පෙන්වා දුන්නේ ය.

- සංස්කෘතිය යන වචනය ප්‍රථම වරට සංකල්පයක් ලෙස භාවිතයට පැමිණියේ 17 වන සියවසේ දී ය. සැමුවෙල් පුෆෙන්ඩොර්ෆ් නම් ජර්මානු නීතිවේදියා සංස්කෘතිය මිනිසාගේ හස්ත නිර්මාණ එනම් කෘත්‍රිම ක්‍රියාකාරිත්වයේ ප්‍රතිඵල ලෙස අවබෝධ කර ගත්තේ ය.

- 'සංස්කෘතිය' යන්න පිළිබඳ විවිධ නිර්වචන ඉදිරිපත්වී තිබේ.

  * කල්චර් (culture) යන වචනය සමාජ හා මානව විද්‍යාවේ යෙදෙන අයුරින් පළමු වරට යොදා ගනු ලැබුවේ ඊ.බී. ටයිලර් (E.B. Tylor) 1871 දී රචිත ආදි කල්පික සංස්කෘතිය (Primitive culture) කෘතියේ ය.

  * ටයිලර්ට අනුව සංස්කෘතිය යනු,''සංස්කෘතිය හෝ සභ්‍යත්වය යනු දැනුම, ඇදහිලි, කලා, නීති, සදාචාර, සිරිත් විරිත් හා මිනිසා සමාජයේ ජීවත් වන පුද්ගලයෙකු වශයෙන් ලබාගත් අනෙකුත් කුමන විධියක හෝ පුරුදු හා හැකියාවන් ඇතුළත් සංකීර්ණ සමස්තය යි. ''

  * බී. මැලිනොව්ස්කි (B. Malinowski) 1944 දී සංස්කෘතියේ විද්‍යාත්මක න්‍යායයන් (Scientific Theory of Culture) කෘතියේ සංස්කෘතිය විග්‍රහ කර ඇත.

    ''උපකරණ, පාරිභෝගික ද්‍රව්‍යය, විවිධ සමාජීය සමූහයන්ගේ ව්‍යූහමය ලක්ෂණ, මානව සංකල්පනා, ශිල්ප, විශ්වාස හා චාරිත්‍රයන්ගේත් අනුබද්ධ සමස්තය සංස්කෘතිය යි. ''

  * සංස්කෘතිය යනු සංකීර්ණ ක්‍රියාවලියකි. සමාජය එකට බැඳ තබන පොදු වටිනාකම්, විශ්වාස, සමාජ ක්‍රියාකාරකම්, නීති, කල්පිතයන් යන්න සංස්කෘතියට ඇතුළත් වේ.

    (Dynamic of Mass Communication - 2010)

- නූතන අවධිය වන විට අශිෂ්ට ම්ලේච්ඡ ස්වභාවික අදෘශ්‍යමාන මැඬපැවැත්විය නොහැකි බලවේගවල ප්‍රතිපාර්ශ්වය ලෙස සංස්කෘතිය තේරුම් ගනී. ඒ අනුව සංස්කෘතිය යනු උගත් බව අධ්‍යාපනය ලත් බව, ශික්ෂිත බව සහ සවිඥානිකතාව ආදියෙන් පිරිපුන් බව යි.

- සංස්කෘතිය, මාධ්‍ය සහ සන්නිවේදනය එකිනෙකට අන්තර් සම්බන්ධිත ත්‍රිත්වයකි.

- 18 වැනි සියවසේ සිට මාධ්‍ය යන වචනය ජන සන්නිවේදන මාධ්‍යයටත් ඓතිහාසික මුල් ම වාහකයා වන පුවත්පත් හැඳින්වීම සඳහාත් යොදා ගන්නා ලදි. 19 වන සියවස මැද භාගය වන විට එය විශේෂ මාධ්‍ය සම්බන්ධතා (තැපැල්, විදුලි සංදේශ) ආධාරයෙන් සන්දේශ ව්‍යාප්ත කිරීම, ප්‍රචාරය කිරීම, බහුලීකරණය කිරීම අර්ථයෙන් භාවිතයට ගන්නා ලදි. පුවත් පත වෙළෙඳ ප්‍රචාරණයේ අතරමැදියෙකු ලෙස මාධ්‍ය සංකල්පය ව්‍යවහාරයට ගන්නා ලද්දේ 20 වන සියවස ආරම්භයේ සිට ය.

- සමාජය, සංස්කෘතිය සහ පුද්ගලයා ඓන්ද්‍රිය ව එකිනෙක වෙන් කළ නොහැකි ලෙස සහසම්බන්ධිත ය. සමාජයටවත්, පුද්ගලයාටවත් සංස්කෘතියෙන් තොර ව පැවතිය නො හැකි ය. මිනිස් ජීවිතය සම්බන්ධ ව සංස්කෘතියේ භූමිකාව සැම දාක ම සේ ම වර්තමානයේ දී ද මූලික වන්නේ ය. සමාජය සංස්කෘතිය, සන්නිවේදනය සහ පුද්ගලයා යන සංරචක අතර ඇත්තේ අවියෝජනීය සම්බන්ධතාවක් පමණක් නො ව අන්‍යෝන්‍ය ක්‍රියාකාරිත්වයකි.

- සමාජය, සංස්කෘතිය, සහ පුද්ගලයා යන මූලික සංරචක පවතින්නේ සහ ක්‍රියාත්මක වන්නේ සන්දේශනය ඔස්සේ සිදු වන සමාජ අන්තර් ක්‍රියාකාරිත්වය නිසා ය.

- පුද්ගලයා සහ සමාජය අතර සංකීර්ණ සම්බන්ධතාවක් පවතී. සමාජය යනු පුද්ගලයන්ගේ හුදු එකතුවක් පමණක් නො ව එය මූලික වශයෙන් සංකීර්ණ අන්තර් සම්බන්ධතා පද්ධතියකි.

- පුද්ගලයාගේ ප්‍රභවයට, හැඩගැස්මට, හැදියාවට ශික්ෂණයට සහ ගතිලක්ෂණවලට සමස්තයක් ලෙස තමා ජීවත් වන සමාජය බලපායි. එසේ ම පුද්ගල, වාර්ගික, ජනවාර්ගික, ජාතික සහ ජනතා විශේෂතා අදාළ සමාජයේ හැඩගැස්මට අදාළ වේ. මෙවැනි සංකීර්ණ සමාජයක් පවත්වා ගෙන යෑම සඳහා සංස්කෘතිය ඇතුළු එහි අනෙක් සියලු මෙවලම් අත්‍යවශ්‍ය වන්නේය. ඊට සන්නිවේදනය, කලාව, ආගම, දේශපාලනය, චිත්‍ර, සිනමාව, දෘෂ්ටිවාදය, ප්‍රචාරණය ආදිය ඇතුළත් වේ. ඒවා එක් අතකින් සමාජ පද්ධතියේ විවිධ කොටස් වන අතර අනෙක් අතින් සමාජය පවත්වා ගෙන යාම සඳහා යොදා ගන්නා මාධ්‍ය ද වන්නේ ය.

- සමාජය සහ පුද්ගලයා අතර සම්බන්ධතාව නිරන්තරව ම ප්‍රතිනිෂ්පාදනය කළ යුතු ය. සමාජය සංකීර්ණ පද්ධතියක් පමණක් නො ව එය ගතික සක්‍රිය පරිණාමයට ලක් වන ඒකකයකි.

- නිරන්තරව වෙනස් වන්නා වූ සමාජයෙහි තත්ත්වයන්ට, කොන්දේසිවලට පුද්ගලයා හුරු කළ යුතු ය. එම තත්ත්වයන්ට සරිලන ආකාරයට හැඩගැස්විය යුතු ය. එම ක්‍රියාවලිය හුදු පුද්ගලික ක්‍රියාවලියක් පමණක් නො ව එය ආයතනිකගත සවිඥානික ක්‍රියාවලියකි.

- මෙම ක්‍රියාවලිය සමාජානුයෝජනය යි. එහි අර්ථය වන්නේ වෙනස් වන සමාජ සංස්කෘතික තත්ත්වයන්ට පුද්ගලයා අනුවර්තනය කිරීම ය, ප්‍රතිහැඩගැස්වීම ය. මෙය පුද්ගලයෙකුගේ උපතේ සිට ම සිදු වන ක්‍රියාවලියකි. ඒ සඳහා මානව සමාජයෙහි සුවිශාල ආයතන සංඛ්‍යාවක් සම්බන්ධ වන්නේ ය. පවුල, පාසල, ආගමික ස්ථාන, දේශපාලන පක්ෂ, විවිධ පුරවැසි සංවිධාන, විශ්වවිද්‍යාල සහ ජන මාධ්‍ය නිදර්ශන ලෙස දැක්විය හැකි ය.

- පෞද්ගලික ජීවිතයේ විවිධ කාලවල දී සමාජානුයෝජන ක්‍රියාවලිය විවිධ ස්වරූපයෙන් සහ විවිධ මට්ටමින් සිදු වේ. තමා ජීවත් වන සමාජයෙහි වඩාත් හොඳින් සහ සාර්ථක ව ජීවත් වීම සඳහා අවශ්‍ය වන්නා වූ ජීවන ශෛලිය, චර්යා රටා, මනෝවිද්‍යාත්මක යාන්ත්‍රණ, සමාජීය ප්‍රතිමාන සහ වටිනාකම් ඊට ඇතුළත් ය. තමන් පොදුවේ චින්තනය සහ සවිඥානිකභාවය අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය සමාජානුයෝජනය ලෙස සැලකේ.

- සමාජානුයෝජන ක්‍රියාවලිය මුළු ජීවිත කාලය පුරා ම සිදු වුවත් පුද්ගල ජීවිතයේ ප්‍රාරම්භක අවධියේ විශේෂයෙන් ළදරු, ළමා, ගැටවර වර්ධන මට්ටම්වල දී ඊට සුවිශේෂ අවධානයක් යොමු කරනු ලැබේ. ප්‍රාරම්භක සමාජානුයෝජන ක්‍රියාවලිය සහ ඊට සම්බන්ධ වන කාරකයන් (ආයතන) වන පවුල, ළදරු පාසල, වැඩිහිටියන් ආදීන් විසින් පුද්ගලයාගේ අනාගත පෞරුෂය සහ දැක්ම හැඩ ගැස්වීමෙහි ලා ප්‍රබල බලපෑමක් සිදු කරනු ලැබේ. අද්‍යතනයේ දී මෙයට ගුවන් විදුලිය, රූපවාහිනිය ඇතුළු නව මාධ්‍යය ද ඇතුළත් වේ.

ඇගයීම

1. සංස්කෘතිය යන්න නිර්වචන ඇසුරෙන් පැහැදිලි කරන්න.
2. පුද්ගලයා, සමාජය, සංස්කෘතිය හා සන්නිවේදනය අතර පවතින සබඳතාව නිදසුන් දෙමින් පැහැදිලි කරන්න.

**නිපුණතා මට්ටම** : 5.2 සංස්කෘති අධ්‍යයනයෙන් සංස්කෘති අතර ඇති විවිධතා හඳුනා ගෙන සංසන්දනාත්මක ව පැහැදිලි කරයි.

**කාලච්ඡේද** : 24 යි.

**ඉගෙනුම් පල** :
- මාධ්‍යයේ වර්ධනයත් සමඟ සංස්කෘතිය වෙනස් වූ ආකාරය පැහැදිලි කරයි.
- මෙම සංස්කෘතිවල විවිධතා හා විශේෂතා පිළිබඳ වෙන් වෙන් වශයෙන් විස්තර කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්:**

පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කරන්න.

- සමාජයෙහි මානවයාගේ ක්‍රියාකාරිත්වය බහුවිධ වේ. එසේ ම ඔවුන් අයත් වන සමාජ ස්ථර අනුව ද එකී ක්‍රියාකාරිත්වයේ ස්වභාවය වෙනස් වේ. එම ක්‍රියාකාරිත්වයේ විකාශය සමඟ සංස්කෘතිය බිහි විය.
- මිනිසාගේ ක්‍රියාකාරිත්වය සම්බන්ධ ව නිරන්තර ව ප්‍රධාන ක්ෂේත්‍ර දෙකක් ලෙස ස්වභාවධර්මය (ප්‍රකෘතිය) සහ සමාජය (විකෘතිය) හැඳින්විය හැකි ය. එම අංශ දෙක ම සංස්කෘතිය තුළ දක්නට ලැබේ.
- සමකාලීන නූතන මානවයාගේ පරිණාමයේ දී සැලකිය යුතු සංස්කෘතික ප්‍රභේද සමූහයක් නිර්මාණය වී ඇති බව පෙනේ.

  - සාම්ප්‍රදායික සංස්කෘතිය (Traditional Culture)
  - ජන සංස්කෘතිය (Mass Culture)
  - සම්භාව්‍ය සංස්කෘතිය (Classical Culture)
  - ජනප්‍රිය සංස්කෘතිය (Popular Culture)
  - මාධ්‍ය සංස්කෘතිය (Media Culture)
  - ගෝලීය සංස්කෘතිය (Global Culture)

**සාම්ප්‍රදායික සංස්කෘතිය** (Traditional Culture)

- එය උත්තරීතර වූ ද පූජනීය වූ ද පරිශුද්ධ වූ ද ජීවන ක්‍රියාකාරිත්වයේ සංවිධාන ප්‍රභේදයකි. එය මූලික වශයෙන් උත්තරීතර සහ පූජනීය සංකේත පද්ධතියක් මත ගොඩනැඟී තිබේ.
- සාම්ප්‍රදායික සංස්කෘතිය මනුෂ්‍ය වර්ගයාගේ ඉතිහාසයේ දීර්ඝතම කාලයන්හි සහ වර්තමානයේ ද පවතින්නකි. එය ජනතාව ම නිර්මාණය කරන ඔවුන් ජෛව සමාජය සහ මානව ද්‍රව්‍යයේ ආවේණික ගති ලක්ෂණවලට අනුකූල ව නිර්මාණය වී ඇති අදාළ ජනතාවගේ උරුමයකි.
- සාම්ප්‍රදායික සංස්කෘතියේ පෝෂණයට ජන සන්නිවේදනයේ භූමිකාව සුවිශාල ය. ජන සන්නිවේදනය සහ සාම්ප්‍රදායික සමාජය අතර අවියෝජනීය භාවයක් පවතී.

- කාර්මික සමාජයේ ක්‍රියාකාරිත්ව පාදක කොට ගෙන සාම්ප්‍රදයික සමාජ සංස්කෘතිය නූතන සමාජ සංස්කෘතියක් බවට පත් වීම ආරම්භ විය. එනම් මධ්‍ය යුගයෙහි සංස්කෘතියේ වර්ධනය නිමාවට පත් කරමින් එය නූතන යුගයට ප්‍රවිෂ්ට විය. නූතන යුගයේ සංස්කෘතිය මූලික වශයෙන් ප්‍රධාන ප්‍රවණතා දෙකක් ඔස්සේ වර්ධනය විය. එක් අතකින් මානව වාදය, බුද්ධිවාදය, විද්‍යාව, දර්ශනවාදය, අධ්‍යාපනය ආදී උසස් වටිනාකම් පාදක ව වර්ධනය වූ සම්භාව්‍ය සංස්කෘතිය ද අනෙක් අතින් විශේෂයෙන් ම 20 වන සියවසේ දෙවන භාගයේ දී ජන සංස්කෘතිය (Mass Culture) සමාජයෙහි ප්‍රමුඛතම ස්වරූපය බවට පත් විය.

ජන සංස්කෘතිය (Mass Culture)

- ජන සංස්කෘතිය යනු සාම්ප්‍රදායික සමාජයෙහි මූලික සහ ආධිපත්‍යයික සංස්කෘතිය වන්නේ ය. ජන සංස්කෘතිය සහ සාම්ප්‍රදායික සංස්කෘතිය අතර ඇත්තේ පොදුභාවයකි. ජන සංස්කෘතිය ජනයාගේ සාමූහික ක්‍රියාකාරිත්වයේ ප්‍රතිඵලයකි. එය ජනතා උරුමයේ අවියෝජනීය කොටසකි.

- ලෝකයේ විවිධ ජනවර්ග 6000ක් පමණ ඇති අතර ඒ සෑම ජන වාර්ගිකත්වයකට ම සිය ජන සංස්කෘතියක් තිබේ. මූලික වශයෙන් සාම්ප්‍රදායික සමාජ අවකාශවල සිය පරිණාමයේ විවිධ මට්ටම්වල ජීවත් වන ජනවර්ග සහ ඔවුන්ගේ සංස්කෘති දැවැන්ත විවිධත්වයක් නිර්මාණය කරන්නේ ය.

- ජන සංස්කෘතිය සාමූහික ප්‍රපංචයක් වන අතර එහි නිර්මාණ අකර්තෘකාරක වේ. ජන සංස්කෘතිය ජනතාවගේ බිම් මට්ටමේ ලැදියා සහ අවශ්‍යතා නියෝජනය කරන්නේ ය. එය ජනතාවගේ නිර්මාණයක් වන අතර එහි ඇත්තේ පොදු වටිනාකම් ය. ජන සංස්කෘතිය ඍජු ලෙස ම සමස්ත සමාජ ක්‍රියාවලිය සමඟ ම සම්බන්ධ වන්නේ ය.

- ජනතාවගේ දෛනික ශ්‍රම ක්‍රියාකාරිත්වය සහ ජන සංස්කෘතිය අතර ඇත්තේ ඍජු සහ අවියෝජනීය සම්බන්ධතාවකි.

- ජන සංස්කෘතිය පාදක ව සම්භාව්‍ය සංස්කෘතීන් බිහි වන අතර ජන සංස්කෘතියට සාපේක්ෂව සම්භාව්‍ය සංස්කෘතිය උසස් සදාචාරාත්මක වූ ද බුද්ධිමය වූ ද ශක්‍යතාවකින් සමන්විත වන්නේය.

- සම්භාව්‍ය සංස්කෘතිය මානව සමාජයේ පරිණාමයේ නිශ්චිත මට්ටමක් සමඟ සම්බන්ධ අතර එය නිර්මාණය කරනු ලබන්නේ ඊට විශේෂ බුද්ධිමය සහ කලාත්මක හැකියාවක් ඇති පුද්ගලයින් විසිනි. ඔවුන් අතර ප්‍රකට ලේඛකයෝ, කලාකරුවෝ, සංගීතඥයෝ, නර්තනවේදීහු චින්තකයෝ සිටිති. එම නිර්මාණ උසස් කලාත්මක සහ සෞන්දර්යාත්මක වටිනාකමකින් අනූන වන අතර ඒවායේ බුද්ධිමය සහ සදාචාරාත්මක මට්ටම ද උසස් තලයක පවතී.

- සමාජ සහ මිනිසාගේ වර්ධනයට බුද්ධිමත් මිනිසාගේ මානව වාදයේ, සබුද්ධිකවාදයේ උසස් පරමාදර්ශයන්ගේ සහ මානව සන්තාවේ උසස් ප්‍රාරම්භයන්ගේ සක්‍රිය දයකත්වය නියෝජනය කරන මානව සංස්කෘතියේ විශේෂ ප්‍රභේදයක් ලෙස සම්භාව්‍ය සංස්කෘතිය හැඳින්විය හැකි ය. එය විද්‍යාවේ, අධ්‍යාපනයේ සහ කලාවේ උසස් ජයග්‍රහණවල ප්‍රතිඵලයකි.

- ජන සංස්කෘතිය සම්ප්‍රදයික මානවවාදී සංස්කෘතියෙන් මූලික වශයෙන් වෙනස් වන්නේ ය. ජන සංස්කෘතිය මානව සමාජ පරිණාමයේ ප්‍රතිඵලයක් වූ අතර එය කාර්මික සහ පශ්චාත් කාර්මික සමාජයෙහි වර්ධනීය අවස්ථාවකි.

- ජන සංස්කෘතික මූලයන් කාර්මික, නාගරික සහ ජන නිෂ්පාදන මාදිලිය සමඟ සම්බන්ධ ය. ජන සංස්කෘතිය බුද්ධිමය, සදාචාරාත්මක, කලාත්මක සහ මානුෂීය මට්ටම සම්භාව්‍ය සංස්කෘතියට වඩා බොහෝ පහත් සහ ප්‍රාථමික මට්ටමක පවතී. එය දශ ලක්ෂ සංඛ්‍යාත ජනතාවක් සඳහා නිර්මාණය කරන්නක් නො ව නිෂ්පාදනය කරන්නකි.
- ජන සංස්කෘතිය (Mass Culture) යන පාරිභාෂිකය ප්‍රථමයෙන් භාවිත කළ 1957 ලිපි සංග්‍රහය සම්පාදනය කළේ ඩේවිඩ් වයිට් (D. White) සහ බර්නාඩ් රොසෙන්බර්ග් (B. Rosenberg) යන අය යි.

( මෙම පාඩමේ දී එය සම්පාදනය කළ ආචාර්ය ටියුඩර් වීරසිංහ විසින් ජන යන වචනයට ''සංහතික'' යන්න යොදන ලද නමුත් දැනට මෙම සමස්ත පාඨමාලාවට ම '' ජන'' යන්න සම්මත ව අන්තර්ගත ව ඇති බැවින් ඊට අප අනුගත වීමු.)

### ජනප්‍රිය සංස්කෘතිය (Popular Culture)

- ජන සංස්කෘතියේ වඩාත් ම ජනාකර්ෂණීය කොටස ජනප්‍රිය සංස්කෘතිය වේ. එනම් ජන සංස්කෘතියේ සම්පිණ්ඩිත සාරය ජනප්‍රිය සංස්කෘතිය වේ. සමහර අවස්ථාවල දී Mass Culture සහ Popular Culture පර්යාය පද ලෙස ද භාවිත කරනු පෙනේ.
- 20 වන සියවසේ දී පරිහානියට පත් වූ සම්භාව්‍ය සංස්කෘතියට විකල්පයක් ලෙස ක්‍රමානුකූල ව ජන සංස්කෘතිය හා එහි උපරි ස්වරූපය ලෙස ජනප්‍රිය සංස්කෘතිය වර්ධනය වන්නට විය.
- ජනප්‍රිය සංස්කෘතියේ විශේෂ ලක්ෂණ අතර එය නොගැඹුරු වීම, සරල වීම, මහා පරිමාණිකව නිෂ්පාදනය වීම, සියලු දෙනාට ම සමීප වීම, සම්භාව්‍ය සංස්කෘතියේ වූ හිඟකම සහ දුර්ලභකම වෙනුවට මෙහි ඇත්තේ අතිරික්තයක් සහ සුලභකමකි.
- මෙය කාටත් පහසුවෙන් රසවිඳිය හැකි වීම, මෙහි බුද්ධිමය සදාචාරාත්මක සහ කලාත්මක මට්ටම හීන වීම, මෙහි පරිභෝජකයන් පොදු ජනතාව වීම නිසා මෙය පරිහරණය කිරීමට, ඇසුරු කිරීමට ස්ථානයක් හෝ වේලාවක් විශේෂ ශ්‍රමයක්, පරිශ්‍රමයක්, මුදලක් මෙන් ම විශේෂ බුද්ධිමය සහ අධ්‍යාපන මට්ටමක් අවශ්‍ය නොවේ.
- එසේ ජන සහ ජනප්‍රිය සංස්කෘතිය ධනේශ්වර නිෂ්පාදන ක්ෂේත්‍රයෙහි ව්‍යාපාරයක් වීම, එනම් සංස්කෘතික ක්ෂේත්‍රය වෙළෙඳ පොළ ක්ෂේත්‍රයක් බවට පත් වීම සෞන්දර්යාත්මක වටිනාකම වෙළෙඳ පොළ මිල මඟින් විතැන්වීම, සංස්කෘතික නිර්මාණවල ගුණාත්මකභාවයේ ඉරණම තීරණය කරන සාධකය බවට ජනමාධ්‍ය පත් වීම, නිර්මාණවල ගුණාත්මක භාවය තීරණය කරන නිර්ණායක බවට සෞන්දර්ය, අධ්‍යාපනය, මානව වාදය, සදාචාරය තව දුරටත් පත් නොවීම දැක්විය හැකි ය.
- වර්තමානයේ මෙම සංස්කෘතියේ නිර්මාපකයන්, නිෂ්පාදකයන් වන්නේ සාමාන්‍ය බුද්ධි මට්ටමක් ඇති, මධ්‍යම ප්‍රමාණයේ නිර්මාණාත්මක හැකියාවක් ඇති, මතුපිට දැක්මක් ඇති පිරිසකි. මෙම ජන සහ ජනප්‍රිය සංස්කෘතිය කර්මාන්තයක් බවට පත් වී ඇති අතර එහි ප්‍රධාන භූමිකා දරන අය අතර ව්‍යාපාරිකයන්, සංවිධායකයන් ආදීන් දැක්විය හැකි ය.

මාධ්‍ය සංස්කෘතිය (Media Culture)

- මාධ්‍ය සංස්කෘතිය මානව වර්ගයාගේ සංස්කෘතික පරිණාමයේ මෑතක දී බිහි වූ නවතම සංස්කෘතික ප්‍රභේදයක් ලෙස හැඳින්විය හැකි ය. විශේෂයෙන් 20 වැනි සියවස මැද දී සංස්කෘතික අධ්‍යයනයේ ප්‍රමාණවත් වශයෙන් බිහි වූ සංස්කෘතිකවේදය (culturology) විෂයයේ ළදරුවෙකු ලෙස මාධ්‍ය සංස්කෘතිය යන ක්ෂේත්‍රය බිහි ව වර්ධනය වන්නට විය.

- සංස්කෘතියෙහි ජනමාධ්‍ය සන්නිවේදන ක්‍රියාවලිය ඓතිහාසික ස්වරූපයක් ගන්නා අතර එය සමාජ අවශ්‍යතා මත තත්ත්වාරෝපණය වෙමින් පුද්ගල සමාජානුයෝජනයට සහ සංස්කෘතියේ ක්‍රියාකාරිත්වයට උපකාරී වන්නේ ය.

- ලෝක සංස්කෘතික අධ්‍යයනයේ ළදරුවෙකු ලෙස මාධ්‍ය සංස්කෘතිය නම් වූ පාරිභාෂික වචනය බිහි වන්නේ 20වන සියවසේ තෙවන කාර්තුවේ දී ය.

- මාධ්‍ය සංස්කෘතිය සමකාලීන සංස්කෘතියේ සුවිශේෂ අංගයකි. එය මානව සමාජ පරිණාමයේ විඥපන (තොරතුරු) අවධියට අයත් සංස්කෘතික ප්‍රභේදයකි.

- එනම් මාධ්‍ය සංස්කෘතිය යනු විඥපන (තොරතුරු) සමාජයේ සංස්කෘතිය වන්නේ ය. මාධ්‍ය යන සංකල්ප ද 20 වන සියවසට අයත් සංකල්පයක් වන අතර එය ප්‍රාරම්භක වශයෙන් භාවිතයට ගන්නා ලද්දේ ජන සංස්කෘතියේ අංග අර්ථවත් කිරීම සඳහා ය.

- 20 වැනි සියවසෙහි මාධ්‍ය සංස්කෘතිය සඳහා අවශ්‍ය වූ සංකල්පීය පදනම නිර්මාණය කළ එක් පුරෝගාමියෙකු බවට පත් වූයේ වෝල්ටර් බෙන්ජමින් ය. විද්‍යාව සහ තාක්ෂණය නිසා කලාත්මක සහ මාධ්‍ය පෙළෙහි සිදු වන තීරණාත්මක වෙනස්කම් රාශියක් පෙන්වා දුන්නේ 20 වැනි සියවසේ තුන්වන දශකයේ දී ය. තාක්ෂණික ප්‍රතිනිෂ්පාදනයේ අතිදැවැන්ත හැකියාව නිසා මුල් කෘතිය සහ අනුපිටපත (කොපිය) අතර පවතින සමාජීය සහ කලාත්මක වෙනස් කම් අතුරුදහන් වන්නේ ය.

- මේ තත්ත්වය තුළ මාධ්‍ය සන්නිවේදන සන්දේශනවල සහ කලා නිර්මාණවල විශේෂත්වය, අද්විතීයත්වය, ප්‍රභාව, ගුප්තභාවය පරමාදර්ශීභාවය, සදනතිකභාවය, උත්කෘෂ්ටභාවය සහ ශ්‍රේෂ්ඨත්වය විකාශය වී ගොස් ඒවා අර්ථ හා රස රහිත එනම් හර සුන් හා රස සුන් (රස හීන) පෙළ බවට පත් වන්නේ ය. වර්තමාන මුද්‍රිත, ගුවන්විදුලි, රූපවාහිනි සමාජ මාධ්‍ය සන්දේශනවල ඇති බහුතරයක මේ තත්ත්වය නිරීක්ෂණය කළ හැකි ය.

- ප්‍රතිනිෂ්පාදන තාක්ෂණය කලා සහ සන්නිවේදන සන්දේශන සාම්ප්‍රදායික ක්ෂේත්‍රයෙන් ඉවත් කොට එහි අද්විතීයභාවය හා ගුණාත්මකභාවය අහිමි කර එය ජන හා ප්‍රාථමික දෙයක් බවට පත් කරයි.

- මාධ්‍ය සංස්කෘතියේ පෙළෙහි මූලික ලක්ෂණය වන්නේ එය පෞද්ගලික සතුටේ, ප්‍රීතියේ, වින්දනයේ පරිභෝජනයේ සිට ප්‍රාථමික ජන පරිභෝජනයේ විහිදී ගිය, බහුවිධ ස්වරූප සහ ශෛලීන් බවට පත් වීම යි.

- විශේෂයෙන් සමකාලීන අර්ථයෙන් මාධ්‍ය සංස්කෘතිය අවබෝධ කර ගැනීම සඳහා මාෂල් මැක්ලුහන්ගේ දයකත්වය සුවිශාල ය. ඔහු මාධ්‍ය සංස්කෘතිය සංකල්පය නිර්මාණය කිරීමෙහි ලා සහ එය පෝෂණය කිරීමෙහි ලා විශාල සංකල්පීය දයකත්වයක් සැපයී ය. මාෂල් මැක්ලුහන් ප්‍රථම වරට මාධ්‍ය සහ සමාජය, මාධ්‍ය සහ සංස්කෘතිය, මාධ්‍ය සහ සන්දේශ,මාධ්‍ය සහ අර්ථ,

මාධ්‍ය සහ මාධ්‍ය සන්දේශ සංජානනය ආදි ප්‍රශ්න පිළිබඳ ව පුළුල් පර්යාලෝකයකින් විග්‍රහ කළේ ය.

- මාෂල් මැක්ලුහන්ගේ මාධ්‍ය සංස්කෘතිය සංකල්පයට අනුව මුළු මානව ශිෂ්ටාචාරය ප්‍රධාන අවධි තුනකට බෙදා දැක්විය හැකි ය. ප්‍රාග් ලිඛිත සංස්කෘතික අවධිය, ලිඛිත-මුද්‍රිත සංස්කෘතික අවධිය සහ දෘශ්‍ය සංස්කෘතික අවධිය ඊට ඇතුළත් වේ. මාෂල් මැක්ලුහන්ගේ මාධ්‍ය සංස්කෘතිය පිළිබඳ සංකල්ප ඉතා පුළුල් ස්වභාවයක් ගන්නා අතර ඊට මිනිස් ක්‍රියාකාරිත්වයට ආධාරක වන සියලු මාධ්‍ය ඇතුළත් වේ. මෙම මාධ්‍ය නිරන්තරව ම වර්ධනය වන අතර එය මිනිසාගේ බාහිර ප්‍රසාරණයක්, විහිදීමක් සහ දිගුවක් ලෙස සලකයි.

- මිනිසාගේ දේහයේ, පංචේන්ද්‍රියන්ගේ, සංවේදනවල සහ ශක්‍යතාවල ඍජු තාක්ෂණික ප්‍රසාරණයක් සහ ව්‍යාප්තියක් ලෙස සිදු වීමට සමගාමී ව ඒවා මිනිසාගෙන් ඉවත් වී පරාරෝපණය වී ඒවා ම මිනිසාට එරෙහිව බාහිර බලයක් ලෙස ක්‍රියා කරයි. මේ ආකාරයට මාධ්‍ය සංස්කෘතියෙහි මිනිසා අන්‍යාක්‍රමණය වීම මැක්ලුහන් උපමාත්මක ව හඳුන්වන්නේ අංග ඡේදනය (Amputation) වශයෙනි.

- මාධ්‍ය සංස්කෘතිය සමකාලීන සමාජයෙහි ඉටු කරන කාර්යයන් අතර විඥපන (තොරතුරු) කාර්ය, සන්නිවේදනාත්මක කාර්ය, දෘෂ්ටිවාදී කාර්ය, ප්‍රතිෂ්ඨාපන කාර්ය, නිර්මාණාත්මක කාර්ය, අනුකලනාත්මක කාර්ය (Intergration) හා අතරමැදි කාර්ය වේ.

- මාධ්‍ය සංස්කෘතිය යනු මාධ්‍ය ක්ෂේත්‍රයෙහි පවතින ද්‍රව්‍යමය සහ අධ්‍යාත්මික වටිනාකම්වල සමස්තය වන්නේ ය. එසේ ම ඒවා සමාජය තුළ ප්‍රතිනිෂ්පාදනයට සහ ක්‍රියාත්මක වීමට ඓතිහාසික වශයෙන් හැඩගැසුණු පද්ධතිය හා ක්‍රමය ද ඊට ඇතුළත් වන්නේ ය.

- මාධ්‍ය සංස්කෘතිය යනු පුද්ගලයා සමාජානුයෝජනය කිරීම සඳහාත් සමාජ මතය හැඩගැස්වීම සඳහාත් උපකාර වන්නා වූ මානව සංහතිය විසින් සිය සංස්කෘතික ඓතිහාසික ප්‍රගමණයේ දී ගොඩනගා ගන්නා ලද තොරතුරු සන්නිවේදනාත්මක මාධ්‍යයන්ගේ සම්ප්‍රේෂණය වේ.

- මාධ්‍ය සංස්කෘතිය තවත් ආකාරයකට අර්ථවත් කරන්නේ නම් එය විවිධ මහාද්වීප සහ රටවල් අතර ද පුද්ගලයා සහ සමාජය අතර ද, රාජ්‍ය සහ සමාජය අතර ද සක්‍රිය ව ක්‍රියා කරන තොරතුරු සන්නිවේදනාත්මක මාධ්‍යයන්ගේ සමස්තය වේ. මාධ්‍ය සංස්කෘතිය තොරතුරු යුගයේ සංස්කෘතියේ සුවිශේෂී ප්‍රභේදයකි.

- ඒ අනුව මාධ්‍ය සංස්කෘතියට තොරතුරු නිෂ්පාදනයේ සංස්කෘතිය, තොරතුරු සම්ප්‍රේෂණයේ සංස්කෘතිය, තොරතුරු සංජානනයේ සංස්කෘතිය, තොරතුරු අවබෝධයේ සංස්කෘතිය, තොරතුරු පරිහරණයේ සංස්කෘතිය, තොරතුරු ඇගයීමේ සංස්කෘතිය, තොරතුරු සන්දේශන නිර්මාණකරණයේ සංස්කෘතිය ඇතුළත් වන්නේ ය. මාධ්‍ය පාදකව සිදු වන සමස්ත මානව ක්‍රියාවලිය මාධ්‍ය සංස්කෘතිය වේ.

**ගෝලීය සංස්කෘතිය (Global Culture)**

- මානව වර්ගයාගේ සමාජ පරිණාමය වර්තමානය වන විට ගෝලීය මට්ටමක් දක්වා වර්ධනය වී ඇත. ගෝලීයකරණය වර්තමාන මිනිසාගේ ජීවිතයේ සියලු ම ක්ෂේත්‍ර ස්පර්ශ කරන්නේ ය. ගෝලීයකරණය, ගෝලීය සම්ප්‍රදාය යන සංකල්පය මුලින් 1981 දී භාවිතයට එක් කරන ලද්දේ ජෝන් මැක්ලීන් (John MacLean) වන අතර ගෝලීය සංස්කෘතිය යන අදහස 1985 දී රොබර්ට්සන් විසින් හඳුන්වා දෙන ලදි.

- ගෝලීයකරණය මූලික වශයෙන් ආර්ථික ක්‍රියාවලියක් වන අතර නිෂ්පාදන බලවේගවල සහ නිෂ්පාදන සම්බන්ධතාවල ලෝක පරිමාණ ව ව්‍යාප්ත වීම සහ සියලු ජාතික, ප්‍රාදේශීය නිෂ්පාදන මාදිලි අභිබවා ගිය පාරජාතීය (Transnational), බහුජාතික (Multinational) සමාගම්වල ක්‍රියාකාරිත්වය මඟින් ලොව පුරා විසිරී පැතිරී පවතින විවිධ ආර්ථික ක්‍රියාකාරකම් ඒකීය සමස්තයක් ලෙස ඒකාබද්ධ ව මෙහෙයවීම ආර්ථිකයේ ගෝලීයකරණය නම් වේ.

- ආර්ථිකයේ ගෝලීයකරණයට සමගාමී ව දේශපාලනයේ, සංස්කෘතියේ, අධ්‍යාපනයේ, මාධ්‍යයේ, ආදි මානව ක්‍රියාකාරිත්වයේ සියලු ම ක්ෂේත්‍ර ගෝලීයකරණයට ලක් වීම අද්‍යතන මානව සමාජ පරිණාමයේ ප්‍රබල ප්‍රවණතාවකි.

- මානව සමාජ පරිණාමයේ ප්‍රතිඵලයක් ලෙස වර්තමානයේ නිර්මාණය වී ඇති ගෝලීය උපරි සමාජය (Global Super Society) සහ ඊට අයත් උපරි ආර්ථිකයේ, උපරි රාජ්‍යයේ, උපරි දෘෂ්ටිවාදයේ, උපරි සංස්කෘතියේ, උපරි මාධ්‍ය සංස්කෘතියේ බලපෑමට, ආධිපත්‍යයට නතු වීම සමකාලීන ගෝලීය වර්ධනයේ විශේෂත්වයකි.

- ඒ අනුව ගෝලීය සංස්කෘතිය යනු අන් කිසිවක් නො ව ගෝලීය උපරි සමාජයේ අනුදැනුම සහ මගපෙන්වීම යටතේ ලොව සියලු ජාතික, වාර්ගික සංස්කෘතීන් විනාශ කරමින් ව්‍යාප්ත වන ජන සංස්කෘතිය යි.

- මෙම සංස්කෘතිය මූලික වශයෙන් සාම්ප්‍රදායික, ජන සහ ජාතික සංස්කෘතික ප්‍රභේදවල ප්‍රතිවිරුද්ධ වන්නේ ය.

- සමකාලීන සංස්කෘතික ගෝලීයකරණයේ දී යථාර්ථවාදී ව සිදු වන්නේ අධිරාජ්‍යවාදී ආකෘතියක් ක්‍රියාත්මක වීම ය. නිදර්ශනයක් ලෙස බොහෝ ජාතික රූපවාහිනී නාලිකාවල ආධිපත්‍යය දරන්නේ ගෝලීය උපරි සමාජය නියෝජනය කරන පාරජාතික සමාගම්වල රූපවාහිනී නිෂ්පාදන ය. ගෝලීය තොරතුරු ප්‍රවාහයෙන් 85% අයත් වන්නේ ගෝලීය උපරි සමාජ සමාගම් පහකට ය.

- සියලු ජාතික සංස්කෘතීන් ඒකාකාර වීම සහ සමජාතිකරණය වීම ගෝලීය ගැටලුවක් බවට පත් වී තිබේ.

- ලෝකයේ දැවැන්ත වෙළෙඳ දැන්වීම් සමාගම් දහයෙන් නවයක් ම අයත් වන්නේ උතුරු අමෙරිකානු සමාගම්වලට ය. වෙළෙඳ දැන්වීම් මඟින් බලහත්කාරයෙන් ලෝකයට ආරෝපණය කරන්නේ බටහිර ජන සංස්කෘතියේ ප්‍රමිතීන් ය. ''යුරෝපා ප්‍රමිතීන්'' ''බටහිර ආකෘති'' ''ඇමෙරිකානු වර්ග'' සියලු ජාතික සංස්කෘතික සිනමාව, සාහිත්‍යය, රූපවාහිනී, සංගීත, ප්‍රාසංගික කලා සහ ලේඛන ආදි නිර්මාණවලට ඇතුළු වී තිබේ. ලොව වඩාත් ජනප්‍රිය චිත්‍රපට 100න් 88ක් අමෙරිකානු ඒවා වන අතර ලොව පුරා රටවල ආනයනය කරන රූපවාහිනී වැඩසටහන් අතරින් 75% අමෙරිකානු ඒවා ය.

- සංස්කෘතියේ ගෝලීයකරණය මඟින් සියලු ම ජාතික සංස්කෘතීන්වලට ආවේණික වූ ආහාර සංස්කෘතිය, භාෂා භාවිතය, විලාසිතා සංස්කෘතිය, අධ්‍යාපන සංස්කෘතිය, ජාතික චින්තන සංස්කෘතිය ආදිය තර්ජනයට ලක් වෙමින් පවතී. ගෝලීය ජන සංස්කෘතිය පැතිරීම නිසා සියලු ජාතික සංස්කෘතීන් ඒකාකාර වීම සහ සමජාතීකරණය වීම ගෝලීය ගැටලුවක් බවට පත් වී තිබේ.

- සමකාලීන සංඛ්‍යාංක තාක්ෂණික පදනම මත සහ ජාලගත සංඛ්‍යාංක ව්‍යූහ මත වර්ධනය වන සමකාලීන ගෝලීය සංස්කෘතික වර්ධනයේ මූලික ප්‍රතිවිරෝධතාව ස්ථානගත වන්නේ ගෝලීය උපරි සමාජ ජන සංස්කෘතිය සහ ජාතික සමාජවල ජාතික, ජනවාර්ගික සංස්කෘතික අනන්‍යතා, විශේෂතා අතර ය.

- සමකාලීන ගෝලීය ජන සංස්කෘතිය සම්ප්‍රදයික සංස්කෘතියට උරුම වූ, ආවේණික ව භූගෝලීය, කාල-අවකාශ සිත් නැති වී යන අතර පුද්ගලයා ගෝලීය ජාලගත ආභාසී අවකාශය තුළ විවෘත වී, ද්‍රාවණය වී යන්නේ අන්තර්ජාලීය සන්නිවේදන සංස්කෘතියේ නියමානුකූලතාවන් ට යටත්ව ය.

**අන්තර් සංස්කෘතික අධ්‍යයනය**

- සීතල යුද්ධය පැවැති කාලයේ ඊට සම්බන්ධ වූ පාර්ශ්වයන් විසින් එකිනෙකාට බලපෑම් කිරීමේ මාධ්‍යක් ලෙස සංස්කෘතිය ද මූලික වශයෙන් යොදා ගන්නා ලදි. එසේ ම අමරිකානු ව්‍යාපාරිකයන්ට, දේශපාලකයන්ට සහ රාජ්‍ය සේවා නිලධාරින්ට වෙනත් රටවල ජාතීන්, ජන වර්ග සහ සංස්කෘතින් සමඟ වැඩ කටයුතු කර ගෙන යාම සඳහා ඒ ඒ රටවල සංස්කෘතීන් සම්ප්‍රදායන් දැන ගැනීමේ අවබෝධ කර ගැනීමේ අවශ්‍යතාව දැඩි ලෙස දෙවන ලෝක යුද්ධයෙන් පසු ව 1950 ගණන්වල දී දැනෙන්නට විය.

- ඒ සඳහා 1947 වසරේ දී අමරිකානු රජය මඟින් විදේශ සේවා ආයතනය (Foreign Service Institute -FIS) ආරම්භ කරන ලදි. එම ආයතනය විසින් අන්තර් සංස්කෘතික, හරස් සංස්කෘතික, අන්තර්වාර්ගික සංස්කෘතික සන්නිවේදනය ආදි ක්ෂේත්‍රවල වර්ධනය සහ ව්‍යාප්තිය සඳහා සුවිශාල මෙහෙවරක් සිදු කරන ලදි. විශේෂයෙන් අන්තර් සංස්කෘතික සන්නිවේදනය නම් වූ සංකල්පය උපත ලබන්නේ 1954 වසරේ දී ය.

- එය එඩ්වර්ඩ් ටී. හෝල් (Edward T. Hall) සහ ජෝර්ජ් එල්. ට්‍රේගර් (George L. Trager) යන පර්යේෂකයන් දෙදෙනා පළ කළ ' සංස්කෘතිය සන්නිවේදනය ලෙස : ආකෘති සහ විශ්ලේෂණය' (Culture as Communication : A Model and Analysis) සහ ඉන් පසු ව එඩ්වර්ඩ් ටී. හෝල් 1950 දී පළ කළ නිහඬ භාෂාව (The Silent Language) කෘතිය අන්තර් සංස්කෘතික අධ්‍යයන ක්ෂේත්‍රයේ තවත් ගැඹුරට අධ්‍යයනය කරමින් සංස්කෘතියේ සමස්ත ක්‍රියාවලිය අධ්‍යයනය කිරීම සඳහා පමණක් නො ව විවිධ සංස්කෘතින්වල චර්යාත්මක, දෛනික උපපද්ධති අධ්‍යයනය කිරීම කෙරෙහි සංස්කෘතිකවේදීන්ගේ වැඩි අවධානය යොමු විය.

- මිනිසා පුද්ගලයා අවට ලෝකයට අනුවර්තනය කර ගන්නා ප්‍රධාන ම උපකරණයක් ලෙස අන්තර් සංස්කෘතික සන්නිවේදනය හැඳින්විය හැකි ය.

- අන්තර් සංස්කෘතික සන්නිවේදනය/අධ්‍යයනය යනු විවිධ ජාතික සංස්කෘතීන්වලට අයත් සන්නිවේදන ක්‍රියාවලිය සහභාගී වන පාර්ශ්ව දෙදෙනෙකු අතර පවතින, හුවමාරු වන අන්‍යෝන්‍ය අවබෝධය වේ.

- මානව වර්ගයාට සෑම දා කම වගේ වෙනත් සංස්කෘතීන් දැන හඳුනා ගැනීමේ කුතුහලයක් පවතී. විවිධ මානව කණ්ඩායම් අතර සංස්කෘතික, චර්යාත්මක හැසිරීම් රටා, ආකල්ප ආදිය අතර සමවිසමතා සොයා බැලීමටත්, සමහර සංස්කෘතික සම්ප්‍රදායන් සැලකිය යුතු මට්ටමෙන් වෙනස්

වන්නේත් සමහර අවස්ථාවල දී එකිනෙකට පරස්පර වන්නේත් ඇයි ද යන්න සොයා බලා අනාවරණය කර ගැනීමට මිනිසා විසින් අතීතයේ සිට ප්‍රයත්න දරන ලදි.

- මෙහි දී ඇතැම් සංස්කෘති උසස් ලෙස දකින්නටත් ඇතැම් සංස්කෘති පහත් ය යි සලකමින් ඒවායේ වටිනාකම් හා හර පද්ධතිවලට නිග්‍රහ කිරීමටත් සංස්කෘති අතර පවතින සම අසමතා විවිධතා පිළිබඳ විවිධ අදහස් ව්‍යාප්ත වීමත් සිදු විය. මෙවැනි පසුබිමක සංස්කෘති පිළිබඳ අධ්‍යයනය කළ යුතු බවට විද්වතුන් අතර කතිකාවත් හා සංවාද මෙන් ම පර්යේෂණ අධ්‍යයනයන් හා න්‍යායයන් බිහි වීමත් එය අන්තර් සංස්කෘතික අධ්‍යයනය විෂයයේ සංවර්ධනයටත් හේතු විය.

- විවිධ සංස්කෘති දරාගෙන ජීවත් වන මිනිසා හා බැඳුණු අප්‍රමාණ සංස්කෘතික ප්‍රකාශනයන් සමුදායක් පවතින අතර මේවා අධ්‍යයනය කිරීමෙන් ඒ ඒ මානව සම්බන්ධතාවන්ගේ සහ සන්නිවේදනයේ පවතින සුවිශේෂතා හඳුනාගත හැකි වේ.

- විශේෂයෙන් ම සන්නිවේදන තාක්‍ෂණයේ දියුණුව සමඟ ලෝකයේ සංස්කෘතීන් පිළිබඳ සමීප ව අධ්‍යයනය කිරීමට සිදු ව තිබේ. ආර්ථික, සමාජීය, දේශපාලනික ගවේෂණ කටයුතු සඳහා සංස්කෘතියෙන් සංස්කෘතියට ඒවායේ වෙසෙන මිනිසුන් හුවමාරු වීම කරණ කොට ගෙන ඇති වූ සංස්කෘතික අනවබෝධයන් හා ඝට්ටනයන් පරීක්‍ෂා කර බැලීමේ හා ඒවා මඟහරවා ගැනීමේ පියවරක් වශයෙන් විවිධ සංස්කෘතීන්ගේ සුවිශේෂතා අධ්‍යයනය කිරීමට ලක් කෙරේ.

- මහාචාර්ය සුනන්ද මහේන්ද්‍රයන් සන්නිවේදන ශබ්දාකරයේ දක්වන පරිදි "මුලින් ම මානව විද්‍යාවේ සහ සමාජ විද්‍යාවේ කාර්යභාරයක් වුව ද මෑතක දී සිට සංස්කෘතීන් පිළිබඳ අධ්‍යයනය කිරීම සන්නිවේදන විෂය ක්ෂේත්‍රයට එක් වී ඇත. සන්නිවේදන විෂය ක්ෂේත්‍රයේ දී එය විවිධ සංස්කෘති තුලනය කිරීම යනුවෙන් හැඳින ගත යුතු ය. එම අධ්‍යයනය අන්තර් සංස්කෘතික අධ්‍යයනය යනුවෙන් හැඳින්වේ. මෙම විෂය ධාරාව සන්නිවේදන අධ්‍යයනයේ ප්‍රවණතාවක් ලෙස සැලකේ. එහි දී එක් සංස්කෘතියක පවතින සමාජ සාධක අධ්‍යයනය කොට ඒ සාධක වෙනත් සංස්කෘතියක සාධකයන් හා සන්සන්දනය කිරීම එක් අරමුණකි.

- ඒ අනුව එක් සංස්කෘතියක් අධ්‍යයනය කිරීමෙන් හඳුනාගනු ලැබූ සාරධර්ම, මානව චර්යාවන්, ජනශ්‍රැතිකාංග වෙනත් සංස්කෘතියක එම සාධක හා සමඟ සැසඳිය හැකි ය. ඒ අනුව එක් සංස්කෘතියක් පිළිගන්නා දේ තවත් සංස්කෘතියක් විසින් එක්කෝ නොපිළිගැනීම හෝ ආගන්තුක ය යි සැලකීම හෝ හැඳින ගත හැකි ය. "

- සන්නිවේදන තාක්‍ෂණයේ ශීඝ්‍ර දියුණුවත් සමඟ රටරටවල ජාතික සංස්කෘති සමීප කර තිබේ. සන්නිවේදන තාක්‍ෂණය ඔස්සේ වඩාත් නිර්මාණාත්මක ස්වරූපයෙන්, විචිත්‍ර ආකෘතිවලින්, වාණිජ වටිනාකම් සහිත ව විවිධ සංස්කෘතීන්හි අංග හුවමාරු වේ. විවිධ සංස්කෘතීන් පිළිබඳ ව අධ්‍යයනය කිරීම හා අවබෝධ කර ගැනීම විචාරශීලී ව මාධ්‍ය පරිහරණය කිරීමට මඟ පෙන්වයි.

ඇගයීම

1. විවිධ සංස්කෘතික ප්‍රභේද පිළිබඳ ඒවාට ආවේණික සුවිශේෂ ලක්‍ෂණ ඇසුරෙන් වෙන් වෙන් ව පැහැදිලි කරන්න.
2. සන්නිවේදන ක්ෂේත්‍රයේ නව ප්‍රවණතාවක් ලෙස අන්තර් සංස්කෘතික අධ්‍යයනයේ වැදගත්කම නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න.

**නිපුණතා මට්ටම** : 5.3 සංස්කෘතිය කෙරෙහි ජනමාධ්‍යයන්ගේ බලපෑම පිළිබඳ විශ්ලේෂණාත්මක ව කරුණු දක්වයි.

**කාලච්ඡේද** : 12 යි.

**ඉගෙනුම් පල** :
- මාධ්‍ය බලපෑම යන්න හඳුන්වා දෙයි.
- මාධ්‍ය මගින් සංස්කෘතිය කෙරෙහි ඇති කරනු ලබන බලපෑම විචාරාත්මක ව පැහැදිලි කරයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්:**

පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කරන්න.

- සංස්කෘතිය, මාධ්‍ය සහ සන්නිවේදනය යන්න එකිනෙකට වෙන් කළ නොහැකි ප්‍රපංච ත්‍රිත්වයකි. නූතන යුගය දක්වා සංස්කෘතිය සහ සන්නිවේදනය සාම්ප්‍රදායික මාධ්‍ය සමග පුළුල් සම්බන්ධතාවක් පමණක් නො ව සාම්ප්‍රදායික මාධ්‍ය පද්ධතිය පාදක ව සංස්කෘතිය හා සන්නිවේදනය වර්ධනය වූ බව පෙන්වා දිය යුතු ය.
- නූතන යුගයේ දී මුලින් ම පුවත්පත්, සඟරා බිහි වීමත් පසු ව ඡායාරූපකරණය, සිනමාව, ගුවන් විදුලිය සහ රූපවාහිනිය ආදි ජනමාධ්‍ය පද්ධතිය බිහි වීමත් පශ්චාත් නූතන යුගයේ දී අන්තර්ජාලය ඇතුළු පරිගණක පාදක සමාජ මාධ්‍ය බිහි වීමත් සමග ම සංස්කෘතිය බිහි වීමේ, පැවැත්මේ, ක්‍රියා කිරීමේ, ව්‍යාප්තිකරණයේ, යාන්ත්‍රණයේ සහ මාදිලියේ ප්‍රබල විපර්යාසයක් ඇති විය.
- වර්තමානයේ ජනමාධ්‍ය, සමාජයේ මානසිකත්ව පැතිකඩ කෙරෙහි ද ජන විඥානය කෙරෙහි ද සමාජ විඥානය කෙරෙහි ද පුද්ගල ස්ව විඥානය කෙරෙහි ද සංස්කෘතිය කෙරෙහි ද අතිවිශාල බලපෑමක් කරනු ලබයි. මේ අනුව පුද්ගල පෞරුෂ හැඩ ගැසීම කෙරෙහි ජනමාධ්‍ය පද්ධතිය බලපෑම තීරණාත්මක වේ.
- සමකාලීන ලෝකයේ තොරතුරු ප්‍රවාහ කොතෙක් දුරට විවිධත්වයකින් සමන්විත වන්නේ ද යත් ඒවා නිසි පරිදි තේරුම් කර ගැනීම තනි පුද්ගලයෙකුට පමණක් නො ව විශේෂඥයන්ට පවා දුෂ්කර කාර්යයකි. ඒ නිසා එම තොරතුරු ප්‍රවාහවලට නතු වන්නන් වෙත සිදු වන බලපෑම අතිමහත් ය.
- වර්තමානයේ ජනමාධ්‍ය යනු මිනිසුන්ගේ මානසික හා සමාජ තත්ත්වය කෙරෙහි බලපාන බලසම්පන්න සාධකයකි. විශේෂයෙන් තරුණ, ශිෂ්‍ය සහ ළමා මානසිකත්වයට සහ ඔවුන්ගේ චර්යාවලට සිදු වන බලපෑම ප්‍රබල වේ. මෙම බලපෑම ධනාත්මක සේ ම සෘණාත්මක ද යහපත් මෙන් ම අයහපත් ද සක්‍රිය මෙන් ම නිෂ්ක්‍රිය ද වන්නේ ය.
- විශේෂයෙන් අද්‍යතන තොරතුරු සහ සන්නිවේදන ක්‍රියාකාරිත්වයේ තාක්ෂණික පද්ධතිය ප්‍රමාණාත්මක ව මෙන් ම ගුණාත්මක ව වර්ධනය වීම ද ව්‍යාපාරික අභිසාරීකරණය ද ජනමාධ්‍ය එහි අන්තර්ගතයන් පුද්ගල සහ සංස්කෘතික විඥානය කෙරෙහි සිදු කරනු ලබන බලපෑම වර්ධනය වීමට හේතු වී ඇත.

- මානවයාගේ ආරම්භයේ සිට ම ඓතිහාසික වශයෙන් ඇති වූ විවිධ මාධ්‍ය පුද්ගලයා සහ සමාජය කෙරෙහි සිදු කර ඇති බලපෑම සමාජ සංවර්ධන ක්‍රියාවලියත් සමඟ උත්සන්න වී ඇති අතර එහි ද එක් එක් මාධ්‍ය ප්‍රභේද සහ ස්වරූප පුද්ගලයා සහ සමාජය වෙත සිදු කරන බලපෑම ඒ ඒ මාධ්‍ය ප්‍රභේදයේ සහ ස්වරූපයේ මෙන් ම විවිධ මාධ්‍ය අතර ඇති සම්බන්ධතාවේ ස්වභාවය අනුව විවිධ මට්ටම් ගෙන තිබේ.
- ඒ අනුව සාම්ප්‍රදායික මාධ්‍යයේ බලපෑමේ ස්වභාවයට වඩා නූතන ජනමාධ්‍යයේ බලපෑම වෙනස් වන්නේ ය. එසේ ම පශ්චාත් නූතන යුගයේ ක්‍රියාත්මක වන නව මාධ්‍යයන්ගේ බලපෑම ජනමාධ්‍යවල බලපෑමට වඩා විශේෂතා දරන්නේ ය.
- මීට අමතර ව ඒ සෑම යුගයක ම වූ මාධ්‍යවල බලපෑම වෙනස් වන්නා සේ ම එක් යුගයක පවතින විවිධ මාධ්‍ය ප්‍රභේද සහ ස්වරූපවල බලපෑමේ විශේෂතා ද දක්නට ලැබේ. සමකාලීන ජනමාධ්‍යයන්ගේ බලපෑම අධ්‍යයනය කිරීමේ දී ප්‍රාදේශීය, ජාතික, කලාපීය, ජාත්‍යන්තර සහ ගෝලීය ස්වභාවයන් සහ ප්‍රවණතා පිළිබඳ ව ද අවධානය යොමු කළ යුතු ය.

**ඇගයීම**

1. ' මාධ්‍ය පුද්ගලයා, සමාජය හා සංස්කෘතිය කෙරෙහි ඉෂ්ට මෙන් ම අනිෂ්ට ආකාරයෙන් ද බලපානු ලබයි.' විචාරාත්මක ව විමසන්න.

**පාරිභාෂික පද**

| | |
|---|---|
| සංස්කෘතිය | - Culture |
| සංස්කෘතිය නිර්වචන | - Definitions of Culture |
| සාම්ප්‍රදායික සංස්කෘතිය | - Traditional Culture |
| ජන සංස්කෘතිය | - Mass Culture |
| සම්භාව්‍ය සංස්කෘතිය | - Classical Culture |
| ජනප්‍රිය සංස්කෘතිය | - Popular Culture |
| මාධ්‍ය සංස්කෘතිය | - Media Culture |
| ගෝලීය සංස්කෘතිය | - Global Culture |
| අන්තර් සංස්කෘතික අධ්‍යයනය | - Cross Cultural Studies |
| මාධ්‍ය බලපෑම | - Media Effect |

**ආශ්‍රිත ග්‍රන්ථ**


1. මහේන්ද්‍ර, එස්., **සන්නිවේදන ශබ්දාකරය**, කොළඹ, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, 1997
2. සෙනෙවිරත්න, අනුරාධ, සංස්කෘතිය හා සමාජය, කොළඹ, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 1996
3. Dominic, Joseph, R., Dhynamic of Mass communication, USA, Maee Grow: Hill (Publisher) 2010